## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය, අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2018.01.08 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, හඟුරන්කෙත යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. මාර්ග කම්කරු තනතුරු සඳහා පමණක් ඉල්ලුම්කරන අයදුම්කරුවන් සේවය කිරීමට කැමති මෙහි සඳහන් සේවා ස්ථානය ද සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම්කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය සහ කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III වන ශ්‍රේණිය | 02 | ප්‍රධාන කාර්යාලය ආශ්‍රිත කටයුතු | PL 3 - 2016<br>රු. 25, 790- 10x270- 10x300- 10x330-12x350 - රු. 38,990 | (I). දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)<br><br>(II). අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය (මෝටර් කෝච් - බර වාහන රියදුරු බලපත්‍රය)හෝ C-ලොරි, C1 - බහුකාර්ය වාහන, D - බස්, D1 වෑන්, G - ට්‍රැක්ටර් පැදවීමේ නිපුණතාවය පිළිබඳ බල පත්‍රයක් ලබා තිබීම, හා රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය සහ කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02. | ආයුර්වේද ඖෂධ සංයෝජක III වන ශ්‍රේණිය | 01 | හඟුරන්කෙත ආයුර්වේද බෙහෙත් ශාලාව හා ඉඩම්පිටිය ආයුර්වේද බෙහෙත් ශාලාවල ඖෂධ සංයෝජන කටයුතු | PL 2 - 2016<br>රු. 25, 250- 10x270- 10x300- 10x330-12x350 - රු. 38,450 | (I) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපනික සහතික පත්‍ර විභාග යෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)<br>හා<br>ඖෂධ සංයෝජක සඳහා නිපුණතා වශයෙන් ,<br>(i) රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුහුණු සහතිකය.<br>(ii) රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසර 2 ක පළපුරුද්ද තිබිය යුතුය. |
| 03. | මාර්ග කම්කරු III වන ශ්‍රේණිය | 11 | ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව දියතිලක කෝරලයේ ප්‍රාදේශීය සහා මාර්ග ආශ්‍රිත කටයුතු තනතුරු - 03<br><br>රිකිල්ලගස්කඩ උප කාර්යාලයට අනුයුක්තව කොහොක කෝරලයේ ප්‍රාදේශීය සභා මාර්ග ආශ්‍රිත කටයුතු තනතුරු - 01<br><br>රිකිල්ලගස්කඩ උප කාර්යාලයට අනුයුක්තව ගන්නෑව කෝරලයේ ප්‍රාදේශීය සභා මාර්ග ආශ්‍රිත කටයුතු තනතුරු - 01<br><br>මතුරට උප කාර්යාලයට අනුයුක්තව උඩගම්පහ කෝරලයේ ප්‍රාදේශීය සභා මාර්ග ආශ්‍රිත කටයුතු තනතුරු - 02 | PL 1 2016<br>රු. 24,250- 10x250 - 10x270 -10x300 - 12x330 - රු. 36,410 | (I) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය සහ කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 04. | ආදහනාගාර ක්‍රියාකරු III වන ශ්‍රේණිය | 01 | හඟුරන්කෙත ප්‍රාදේශීය සභා ආදහනාගාරය ආශ්‍රිත කටයුතු | PL 2 - 2016 රු. 25, 250- 10x270- 10x300- 10x330-12x350 - රු. 38,450 | (I) දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර) |
| 05. | ආදහනාගාර ක්‍රියාකරු සහායක III වන ශ්‍රේණිය | 01 | හඟුරන්කෙත ප්‍රාදේශීය සභා ආදහනාගාරය ආශ්‍රිත කටයුතු | PL 1-2016 රු. 24,250- 10 x250 - 10 x 270 -10 x 300 - 12 x 330 - රු. 36,410 | (I) දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)<br>(II) ආදහනාගාර ක්‍රියාකරණය සම්බන්ධව මෙම වෘත්තීයට අදාළව සහතිකයක් හෝ පළපුරුද්ද පිළිබඳව සහතිකයක් තිබීම. |
| 06. | ක්ෂේත්‍ර වැඩ පරීක්ෂක III වන ශ්‍රේණිය | 01 | හඟුරන්කෙත ප්‍රාදේශීය සභා ක්ෂේත්‍ර වැඩ පරීක්ෂක කටයුතු | MN 1 2016 රු. 27,140- 10 x 300 - 11 x 350 -10 x 495 - 10 x 660 - රු. 45,540 | (I) දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)<br>*හා*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 1 ක් වත් සමත් විය යුතුය. (පොදු පරීක්ෂණය හැර)<br>***වෘත්තීය සුදුසුකම්*** -: ක්ෂේත්‍රයට අදළ කාර්මික විද්‍යාලකින් ලබා ගත් ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
5. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
6. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
7. රියදුරු තනතුරු සඳහා ඉල්ලුම්කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළ ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවාග ගනු ලැබේ.
8. රියදුරු තනතුරු සඳහා ඉල්ලුම්කරන සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
9. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.
10. දැනටමත් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් හෝ කුළී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මඟින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
11. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලටද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතුය.
12. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

03. *සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :*

- මෙම සියලු තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය;
- වැන්දඹු/ පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය;
- බඳවාගනු ලබන අය වසර තුනක පරිවාස කාලයට යටත්ය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ;
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාදිය යුතුය;
- බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත්විය යුතුය;
- යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කවර බල ප්‍රදේශයක් තුළ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය;
- දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය;
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
- අවශ්‍ය වුවහොත් බල ප්‍රදේශයේ පදිංචි විය යුතුය. මේ පිළිබඳ කිසිදු ලිපි ගනුදෙනු කිරීමක් සිදු නොකෙරෙන බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.
- සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙළ කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2018.01.08 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, හඟුරන්කෙත." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තැපෑලේ දී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය,
2. ජාතික හැඳුනුම්පත,
3. අධ්‍යාපන සහතික,
4. ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතු ය.),
5. වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික,
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
7. මෑතක දී ලබාගත් චරිත සහතික 02.

එම්. ආර්. එම්. ඒ. කේ. රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
හඟුරන්කෙත.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ ........................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය.*

1. සම්පූර්ණ නම :————————.
2. ලිපිනය :————————.
3. උපන් දිනය :————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————————.(ඡායා පිටපතක් ඇමිණිය යුතුය)
5. 2018.01.08 දිනට වයස :————————.
6. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන වග :————————.
7. විවාහක ද/ අවිවාහක ද යන වග :————————..
8. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර
   (i) තනතුරේ නම :————————.
   (ii) එයට පත් වූ දිනය :————————.
   (iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :————————.
   (iv) මැතිවරණ කොට්ඨාසය :————————..
   (v) පළපුරුද්ද හා සේවා කාලය :————————.
9. අධ්‍යාපන සුදුසුකම් :————————.
   (සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)
   අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් වර්ෂය :———————— විභාග අංකය :————————

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

10. වෘත්තීය සුදුසුකම් :————————————.

11. වෙනත් සුදුසුකම් :————————————.
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

12. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටී ද? ඔව්/ නැත
ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය :————————————.
(ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක)

ඉහත සඳහන් අංක 01 - 13 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටක දී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම්ගෙන ඇති බවත්, ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

**දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ............................................................. යන අය මෙම ආයතනයේ ..................................... වශයෙන් ........................... දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව.

දිනය :————————.

නම :————————————.
තනතුර :————————————.
ආයතනය :————————————.